# නොතේරෙන සංරචක හෙවත් නොදන්නා දෙමළය - 3

ලාංකික නමින් සිතන අය මෙරට විරල වෙති. මා ඒ බව සඳහන් කෙළේ අද සමාජයේ බොහෝ දෙනා තම ජාතිය ගැන සිතන ආකාරය පෙන්නුම් කිරීමට ය. එහෙත් බයිලා කතුවරයාට එවැනි කරුණු ගැන සංයමයකින් තොයාබැලිය නො හැකි ය. ඒ බව ලාංකික නමින් ජාතියක් ඇති නම් එහි භාෂාව කුමක් ද යන ප්‍රශ්නය මා මතුකරයි යනුවෙන් සඳහන් කිරීමෙන් පෙනෙයි. මම එවැනි ප්‍රශ්නයක් මතු නො කෙළෙමි. අදාළ ලිපියෙහි මා කියා ඇත්තේ ලාංකික නමින් ජාතියක් ඇත්නම් එහි භාෂාව කුමක් දැයි අසන්නෝ ද වෙති යන්න ය. එහි කිසි තැනක මා එවැනි ප්‍රශ්නයක් අසන බවක් කියා නැත. බයිලා කතුවරයා පූර්ව නිගමනයකට පැමිණ ඇත. ඒ නිගමනය පාඨකයාගේ පහසුව සඳහා මම නැවතත් සඳහන් කරමි. ඒ මෙසේ ය. මහාචාර්යවරයා ප්‍රධාන සංරචකය පිළිබඳව ලියන විවරණයේ දී නව ජාතියක් නිර්මාණයකිරීමේ ප්‍රශ්නය ගැන ද කතාකිරීමට උත්සාහ කර තිබේ. ලාංකික ලෙස සිතන අය රටේ විරල බව ඔහු කියයි. ලාංකික නමින් ජාතියක් ඇති නම් එහි භාෂාව කුමක් ද යන ප්‍රශ්නය ඔහු මතු කරයි. ඔහු සිතන්නේ දැනටමත් ජාතියක් බවට පත්ව ඇති සිංහල ප්‍රවාහයට ජාතියක් බවට පත්ව නැති අන් වර්ග ද එකතුවීම මගින් සියලු දෙනා සිංහල සංස්කෘතියේ ම අතුරු සංරචක බවට පත්වී මෙම අර්බුදය විසඳාගත යුතු බව ය.

මා මේ සම්බන්ධයෙන් වසර විස්සක පමණ කාලයක ලිපි රාශියක් ලියා ඇත. එහෙත් ඒ කිසිදු ලිපියක එවැන්නක් ලියා ඇතැයි නො සිතමි. එවැන්නක් සඳහන් ලිපියක් ජාතිය සංස්කෘතිය හා චින්තනය පොත පළවීමෙන් පසු ලියා ඇත්නම් ලිපිය පළවී ඇති පුවත්පත (සඟරාව) හා ලිපිය පළවී ඇති දිනය දන්වන්නේ නම් කෘතඥ වෙමි. සංස්කෘතියෙහි ප්‍රධාන සංරචකය නමින් ලියැවුණු ලිපියෙහි පවා සඳහන් ව ඇත්තේ දෙමළ හා (මුවර්) මුස්ලිම් ජනයා සිංහල කිරීමට කතාකිරීම නිෂ්ඵල බව ය. බලන්නාට පෙනෙන්නේ බලන ආකාරයට ය. බයිලා කතුවරයාට මගේ ඒ ලිපිය පෙනී ඇත්තේ ඔහු මා ගැන (එනම් මගේ ලිපි ගැන) බලන ආකාරයට ය. ඔහු මගේ ලිපි බලන්නේ (කියවන්නේ) පූර්ව නිගමනයක සිට ය. එවිට ඔහුට ඒ ලිපි පෙනෙන්නේ (තේරුම් යන්නේ) ඒ පූර්ව නිගමනයට අවශ්‍ය ආකාරයට ය.

මා කියා ඇත්තේ මෙරට පොදු සංස්කෘතියක් තිබිය යුතු බව හා එහි ප්‍රධාන සංරචකය සිංහල සංස්කෘතිය විය යුතු බව ය. සංරචකය යන්නෙන් කියැවෙන්නේ කුමක්දැයි නොතේරෙන බයිලා කතුවරයා කියන්නේ ජාතියක් බවට පත්වී නොමැති අන් වර්ග ජාතියක් බවට පත්වී ඇති සිංහල ප්‍රවාහයට එක් වී සියළු දෙනාම සිංහල සංස්කෘතියේ අතුරු සංරචක බවට පත්වී ප්‍රශ්නය විසඳාගත යුතු බව ය. මා ඊනියා අතුරු සංරචකයක් ගැන කිසිම දාක කිසිම ලිපියක සඳහන්කර නැත. වචන නොතේරෙන අය පුවත්පත් කතුවරුන් වී වචන පාවිච්චිකිරීමේ දී කරන හානිය අළුත් ගුවන් විදුලි නාලිකාවල නිවේදක නිවේදිකාවන් වචන යොදාගැනීමේ දී කරන හානියට ද වඩා බලවත් වන්නේ මේ කතුවරුන් යම් යම් දේ හෝ දන්නා බව ජනතාව විශ්වාස කරන බැවිනි. මගේ සූත්‍රගත කිරීම අනුව සිංහල සංස්කෘතිය මෙරට පොදු සංස්කෘතියේ ප්‍රධාන සංරචකය වුව ද එය මෙරට පොදු සංස්කෘතියේ තවත් සංරචකයක් පමණකි. බයිලා කතුවරයාට අනුව නම් මා කියා ඇත්තේ අනෙක් සංස්කෘතීන් සිංහල සංස්කෘතියේ ඊනියා අතුරු සංරචක විය යුතු බව ය. සංරචකය යන සංකල්පය මා අහුලා ගත්තේ බටහිර ගණිතයෙන් හා භෞතික විද්‍යාවෙන් ය. ඒ ඉංගිරිසියෙන් කොම්පෝනන්ට් යන වචනයේ පරිවර්තනය ය. මා ඒ බව සඳහන් කෙළේ බයිලා කතුවරයාට වෙනත් අයකුගෙන් හෝ සංරචකය යනු කුමක්දැයි අසා දැනගැනීම පහසුකිරීම සඳහා ය.

ලෝකයේ බොහෝ රටවල ඇත්තේ පොදු සංස්කෘතියක් හා එහි සංරචක නොව එක් ප්‍රධාන සංස්කෘතියක් හා ඒ සමග පවතින ආන්තික (මාජිනල්) සංස්කෘතීන් ය. ඉංගිරිසිහු තම රටේ සංස්කෘතිය ලෙස ඉංගිරිසි සංස්කෘතිය, වඩාත් නිරවුල්ව කියන්නේ නම් ඉංගිරිසි ක්‍රිස්තියානි (ඇංග්ලිකන්) සංස්කෘතිය ගනිති. එහි සිංහලයන් ද ඇතුළු වෙනත් සංස්කෘතීන්ට අයත්වූවන් සිටිය ද ඒ අනෙක් සංස්කෘති ආන්තික සංස්කෘති වෙයි. ඕස්ට්‍රේලියාවේ ද සංස්කෘතිය ඇංග්ලො සැක්සන් ක්‍රිස්තියානි සංස්කෘතිය ය. (වැඩිම වුවහොත් ඇංග්ලො සැක්සන් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි සුළු විකෘතියක් යැයි කිව හැකි ය.) ඕස්ට්‍රේලියාවේ පොදු සංස්කෘතියක් නැත. එහි ග්‍රීක, ලෙබනන් ආදී වෙනත් සංස්කෘතීන් හි ජනයා ද ජීවත්වන බව පැහැදිලි ය. එහෙත් එපමණකින් ඒ අනෙක් සංස්කෘතීන් ඕස්ට්‍රේලියාවේ පොදු සංස්කෘතියක සංරචක ලෙස නො සැලකෙයි. එයට හේතුව ඕස්ට්‍රේලියාවේ පොදු සංස්කෘතියක් නො මැති වීම ය. ඕස්ට්‍රේලියාව බහු සංස්කෘතික රටක් යනුවෙන් හැඳින්වෙන්නේ විවිධ සංස්කෘතීන්ට අයත් ජනයා එහි ජීවත්වන්නේ ය

© Prof. Nalin De Silva

යන අර්ථයෙන් මිස වෙනත් අර්ථයකින් නො වෙයි. එරට සංස්කෘතිය ක්‍රිස්තියානි සංස්කෘතිය වන අතර අනෙක් සංස්කෘතීන් ද පවතියි. ඒ පවතින්නේ මධ්‍යයෙහි නොව ආන්තික ව පරිධියෙහි ය. එරට සර්ව ආගමික උත්සව වැනි ව්‍යාජ නාටක නැත.

ඉන්දියාවේ තත්වය කුමක් ද ? ඉන්දියාවේ ව්‍යවස්ථාව අනුව නම් ඒ ඊනියා ඓහික (අනාගමික) රාජ්‍යයකි. ව්‍යවස්ථාවේ කුමක් තිබුණ ද, ඉන්දියාව හින්දු රාජ්‍යයකි. එහි ඇතැම් විටක ආගමින් හින්දු නොවන අගමැතිවරයකු හෝ ජනාධිපතිවරයකු හෝ සිටිය හැකි ය. එහෙත් ඒ අගමැතිවරයා හෝ ජනාධිපතිවරයා හෝ ආගමින් හින්දු නොවුණ ද සංස්කෘතියෙන් හින්දු වෙයි. ඉන්දියාවේ ව්‍යවස්ථාව සම්පාදනය කිරීමේ දී මහඟු කාර්යයක් කළ අම්බෙඩ්කාර් මහතා ව්‍යවස්ථාවේ කුමක් තිබුණ ද සමාජයේ හින්දු සංස්කෘතිය ප්‍රධාන සංස්කෘතිය බව දැන සිටියේ ය. ඒ මහතා ඩැලිට් යන නමින් හැඳින්වෙන ඊනියා කුලහීනයන් ලක්ෂ සංඛ්‍යාත සංඛ්‍යාවක් සමග බෞද්ධ වූයේ හින්දු සමාජයෙන් යම්තමින් හෝ නිදහස් වීමට ය. එහෙත් අද සිදු වී ඇත්තේ කුමක් ද ? ඉන්දියාව අද සමස්තයක් ලෙස ගත්කල බෞද්ධයන් කුලහීනයන් ලෙස සලකයි. ඊනියා කුලහීනයන් බෞද්ධ වීමේ ප්‍රතිඵලය වී ඇත්තේ බෞද්ධයන් කුලහීනයන් බවට පත්වීම ය. එසේ කුලහීනයන් බවට පත්වන්නේ හින්දු සංස්කෘතියෙහි මිස වෙනත් සංස්කෘතියක නො වේ. ඉන්දියාවේ ඇතැම් පළාත්වල බෞද්ධයකු යැයි කිවහොත් කෙළ ගසන්නේ යැයි කියනු ලැබේ.

අම්බෙඩ්කාර් මහතා තැත්කළ ද බෞද්ධ වීමෙන් වුව ද ඉන්දියාවේ හින්දු සමාජයෙන් හා සංස්කෘතියෙන් පැනගිය හැකි නො වේ. අද ඉන්දියාව සෝනියා ගාන්ධි මහත්මියට සලකන්නේ ඊනියා බහු සංස්කෘතියක් නිසා නොව ඇය හැකි පමණින් හින්දු සංස්කෘතියට ඇතුල්වී ඇති බැවිනි. ඉස්ලාම් භක්තිකයකු වූ කාලාම් මහතා ජනාධිපති බවට පත්කිරීම හුදු ප්‍රදර්ශනාත්මක ක්‍රියාවකට වැඩි දෙයක් නො වේ. ඔහුට තවත් වරක් ජනාධිපතිවීමට ඉඩ නොදීමට කොංග්‍රස් පක්ෂය වග බලාගත්තේ ය. දැන් ජනාධිපති වී සිටින්නේ හින්දු සංස්කෘතිය අඩුවක් පාඩුවක් නැතිව නියෝජනය කරන පතෙල් මහත්මිය ය. ඉන්දියාව ජාතියක් ලෙස සාර්ථක වී ඇතැයි කියන්නේ නිල ප්‍රකාශ ඔස්සේ ය. එහෙත් නොබෝදා නිදහස දිනාගැනීමේ හැටවස සැමරූ ඉන්දියාවට තවම ජාතියක් වීමට නොහැකි වී ඇත. දි අයිලන්ඩ් පුවත්පතේ පළවන කුල්ඩිප් නායර් මහතාගේ ලිපි කියවීමෙන් මේ පිළිබඳ තත්වය තවදුරටත් තේරුම්ගත හැකි ය.

මෙරට (මුවර්) මුස්ලිම් හා දෙමළ යනුවෙන් සංස්කෘතික ධාරා දෙකක් ඇති වී වැඩි කලක් ගත වී නැත. මෙරට ඇති පැරණිම මුස්ලිම් පල්ලිය කුමක් ද ? ඒ තැනුවේ කිනම් වසරක ද ? ආදී ප්‍රශ්නවලට පිළිතුරු දීමේ දී  මුස්ලිම් සංස්කෘතියෙහි ඉතිහාසය දැනගත හැකි ය. ඉතා දීර්ඝ ඉතිහාසයක් මුස්ලිම් සංස්කෘතියට නැති වුව ද මෙරට පොදු සංස්කෘතියෙහි ඒ පිළිබිඹු වෙයි. මෙරට පිරිමි අති විශාල බහුතරය ගෙදරට අඳින සරම අපට ලැබුණේ මුස්ලිම් සංස්කෘතියෙනි. එය මෑතක් වන තුරුම මෙරට පොදු සංස්කෘතියෙහි කොටසක් බවට පත් වී තිබුණි. අද ඒ නැති වී යන්නේ තරුණයන් අඳින්නට පුරුදුවන තුන්කාල් කලිසම හේතුකොටගෙන මිස සිංහල සංස්කෘතික ආක්‍රමණයක් නිසා නො වේ. එසේ වුවත් වටලප්පම් හා බුරියානි ඉක්මණින් මෙරට පොදු සංස්කෘතියෙන් ඉවත් වේ යැයි සිතිය නො හැකි ය. ඒ ද යටවුවහොත් එසේ වන්නේ මැකාඩොනල්ඩ් සංස්කෘතියට මිස සිංහල සංස්කෘතියට නො වේ. (1990 දී පමණ පළවූ ජාතිය සංස්කෘතිය හා චින්තනය පොතෙහි මෙවැනි කරුණු සාකච්ඡා කෙරී ඇත.) මෙරට දෙමළ සංස්කෘතියට ද අඛණ්ඩ ඉතිහාසයක් නැත. මෙරට වත්මන් දෙමළ සංස්කෘතියෙහි ආරම්භය ලන්දේසීන් දුම්කොළ වගාවට මෙරටට දකුණු ඉන්දියාවෙන් ජනයා ගෙන ආ දිනයෙන් ඈතට නො යයි. එහෙත් මෙරට පොදු සංස්කෘතියෙහි දෙමළ හින්දු සංරචකය පැහැදිලිව පෙනෙන්නට ඇත.

අපට ජාතියක් විය හැක්කේ ඉංගිරිසින්, ඕස්ට්‍රේලියානුවන්, ඉම්දියානුවන් හෝ වෙනත් ජාතියක් අනුගමනය කිරීමෙන් නො වේ. ඒ ඒ රටවල ඇත්තේ එක් එක් ප්‍රධාන ජාති හා ආන්තික ජනවර්ග ය. ඒ රටවල පොදු සංස්කෘතියක් නැත. එහෙත් ලංකාව දැනටමත් පොදු සංස්කෘතියක් ඇතිකර ගැනීමේ දිශාවට බොහෝ දුර ගොස් ඇත. පොදු සංස්කෘතියක පොදු ආගමක් තිබිය යුතු නො වේ. එමෙන් ම පොදු සංස්කෘතිය සමජාතීය (ඉංගිඑසියෙන් නම් හෝමෝජීනියස්) සංස්කෘතියක් විය යුතු ද නො වේ. එහි ප්‍රාදේශීය වෙනස්කම් තිබිය හැකි ය. අපට පොදු සංස්කෘතියක් ගොඩනගා ගැනීමට බාධා කරන්නෝ මැක්ඩොනල්ඩ් ප්‍රජාතන්ත්‍රවාදියෝ ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva